Faculty of Social
Sciences
University of Kelaniya
Sri Lanka

# ග්‍රාමීය ණය අවශ්‍යතාව සපුරාලීම සඳහා සමුපකාර ග්‍රාමීය බැංකුවල දායකත්වය

## (ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන්)

**බී.එම්.ඒ.එස්.බාලසූරිය**[1]

**ප්‍රසංසා කුමාරි**[2]

---


## සංක්ෂේපය

ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ විශේෂ අවධානයක් ග්‍රාමීය අංශය වෙත යොමු වී තිබේ. ග්‍රාමීය ජනතාවගේ ආදායම් මට්ටම අඩුවීම තුළින් ඔවුන්ගේ මුල්‍ය අවශ්‍යතා සපුරාලීමේ දී වැඳගත් මෙහෙයක් ග්‍රාමීය අංශයේ මුල්‍ය ආයතන වලින් ඉටුවන බවක් පෙනෙන්නට තිබේ. ග්‍රාමීය මුල්‍ය ආයතන අතර සමුපකාර ග්‍රාමීය බැංකුව ග්‍රාමීය ජනතාවගේ මුල්‍ය අවශ්‍යතා සපුරාලීමේ දී වැඳගත් මෙහෙයක් ඉටුකරනු ලබයි. මුල්‍ය ශක්තිය ගැමියාගේ ප්‍රශ්න සමඟ සම්බන්ධ කිරීමේ උත්සාහයක් ලෙස ග්‍රාමීය බැංකු ස්ථාපිත කිරීමක් පෙනෙන්නට තිබේ. ග්‍රාමීය ණය අවශ්‍යතා සපුරාලීමේදී සමුපකාර ග්‍රාමීය බැංකුවට හැකියාවක් ලැබී තිබේ ද යන්න අධ්‍යයනය කිරීම ප්‍රධාන අරමුණ කර ගනිමින්, ග්‍රාමීය ජනතාව ණය ලබාගැනීමට පෙළඹීමට හේතු හඳුනා ගැනීම හා ග්‍රාමීය බැංකු මඟින් ග්‍රාමීය ජනතාවගේ දිළිඳු බවට විසඳුමක් ලබා දීමට කටයුතු කර තිබේ ද යන්න අධ්‍යයනය කිරීම අරමුණු කර තිබේ.

මෙම පර්යේෂණය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සමුපකාර ග්‍රාමීය බැංකු 08ක් අතරින් මහනාන්නේරිය සමුපකාර ග්‍රාමීය බැංකුව තොරාගෙන තිබේ. එහි දී එම බැංකුව සමඟ ගනුදෙනු කරන ගනුදෙනුකරුවන් 100 දෙදෙකුගේ නියැදියකින් ප්‍රශ්නාවලියක් ඔස්සේ දත්ත රැස්කර තිබේ. දත්ත රැස්කිරීමේ දී ප්‍රාථමික දත්ත ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් ද ද්විතීයික දත්ත ආර්ථික විමසුම් සටහන්, මහ බැංකු වාර්තා, පුවත්පත්, සඟරා, පොත්පත් මඟින් ද රැස්කර තිබේ. දත්ත විශ්ලේශණය කිරීමේ දී ලබා ගන්නා ලද දත්ත SPSS හා EXCEL මෘදුකාංග මඟින් විශ්ලේෂණය කිරිමක් සිදුකර තිබේ. මෙම ක්‍රමය යටතේ විශ්ලේෂිත දත්ත වගු, ප්‍රස්තාර, ප්‍රතිශත, සටහන් යන ආදී ක්‍රම යටතේ පෙළගස්වා තිබේ. ග්‍රාමීය ජනතාව වැඩි වශයෙන් ණය ලබා ගැනීමට පෙළඹීමට හේතු ලෙස හදිසි අවශ්‍යතා, ස්වයං රැකියා ආරම්භ කිරීම, හා කෘෂිකාර්මික කටයුතු සඳහා බව පෙන්වා දිය හැකිය. එමෙන්ම ග්‍රාමීය බැංකුව මඟින් ග්‍රාමීය දිළිඳු ජනතාව නඟා සිටුවීමට කටයුතු කර තිබෙන බවක් පර්යේෂණය තුළින් පෙනෙන්නට තිබේ. ග්‍රාමීය අංශය තුළ ග්‍රාමීය ජනතාව සිය ණය අවශ්‍යතා වැඩි වශයෙන් අවිධිමත් මුල්‍ය ආයතන වලින් සපුරා ගැනීමට යොමු වුව ද වර්තමානය වන විට විධිමත් මුල්‍ය ආයතන ග්‍රාමීය මට්ටමින් ස්ථාපිත වීමත් සමඟ ග්‍රාමීය ජනතාව විධිමත් මුල්‍ය ආයතන කෙරෙහි, විශේෂයෙන්ම සමුපකාර ග්‍රාමීය බැංකු කෙරෙහි වැඩි විශ්වාසයක් හා නැඹුරුවක් දක්වමින් සිය මුල්‍ය අවශ්‍යතා ඉටුකර ගැනීමට යොමුවීමේ ප්‍රවනතාවයක් පෙනෙන්නට තිබෙන බවක් නිගමනය කළ හැකිය.


මුඛ්‍ය පදඃ ග්‍රාමීය අංශය, සමුපකාර ග්‍රාමීය බැංකුව, මුල්‍ය, ණය අවශ්‍යතා.

---

*1. ආර්ථික විද්‍යාව, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*